# මල් කුමාරියෝ



සෙනුති මල්ලවආරච්චි

# මල් කුමාරියෝ

## සෙනුති මල්ලවආරච්චි

කතාව සහ චිත්‍ර
සෙනුති මල්ලවආරච්චි

ISBN 978-624-206-907-4

වෙනත් කෘති - චූටිගේ අපූරු තෑග්ග

කෘතිය පළ කරන දිනය - 2023.11.15

# පිදුම

මගේ දෙමාපියන්ට

සහ

උදවු කල

සියලු දෙනාට

ආදරයෙන්

පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුලින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුලින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි

ශශිකලා සේනාධීර

විදුහල් පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 10 20

එකෝමත් එක කාලෙක අහිංසායි අයංසායි කියලා මල් කුමාරියෝ දෙන්නෙක් හිටියා.

අහිංසාට යාළුවෝ ගොඩයි,

නමුත් අයංසාට යාළුවෝ හිටියේ නැහැ.

මේ හින්දා අයංසා නිතරම හිටියේ හරිම දුකෙන්..



එයා වළාකුලක් උඩට වෙලා ඒ ගැන කල්පනා කර කර හිටියා.



අහිංසා එයාව දැකලා එතනට ආවා.

''ඇයි එයා ඔහොම දුකෙන් ඉන්නේ ?'' කියලා අහිංසා ඇහුවා.

අයංසා තරහින් කතා කරා.



''ඔයාට ගොඩක් යාළුවෝ ඉන්නවා.''

''ඒත් මට කවුරුත් කැමති නැහැ ඒ ඇයි ?''

''මාත් මෙතනින් වාඩිවෙන්න ද ?'' අහිංසා ඇහුවා.


''මම කියන දේ ඔයා අදම කරන්න,

එතකොට ඔයා හිතනදේ ඔයාට ලැබෙයි.'' අහිංසා හිනාවෙලා කිවුවා.


අහිංසා එහෙම කියලා වළාකුලක නැගලා ඈතට පාවෙලා ගියා.

අහිංසා එයාව හොයාගෙන ඒ පැත්තට ගියා.

එහෙම යනකොට වේලුනු අඹ ගහක් හමුවුණා.
අයංසා වටපිට බැලුවා.



ළඟ තිබුණු පොකුණකින් වතුර ටිකක් අරගෙන ඉක්මනට අඹ ගහට දැම්මා.



''ඔයාට බොහොම ස්තූතියි., මේ අඹ ගෙඩිය කන්න.'' අයංසාට හරිම පුදුමයි, අඹ ගහ කතා කරන නිසා.

''හරිම රසයි.'' කියලා අඹ ගෙඩිය කෑවා. අයංසාගේ මුළු ඇඟම රත්තරන් පාටින් ලස්සනට දිළිසෙන්න පටන් ගත්තා.අයංසා අඹ ගහට ''බොහොම ස්තූතියි.'' කියලා කිවුවා.

''ඔහොම ඉස්සරහට යන්න'' අඹ ගහ කිවුවා.



තවත් ඉස්සරහට යනකොට අයංසාට මුව පැටියෙක් හමුවුණා.

''අනේ මාව බේරා ගන්න'' මුව පැටියා දුකෙන් කිවුවා.



අයංසා ලංවෙලා බැලුවා. මුව පැටියාගේ අංතට්ටුව ගහක අත්තකට පැටලිලා තිබුණා.

අයංසා පරිස්සමින් මුව පැටියාව බේර ගත්තා.

''උදව් කරාට බොහොම ස්තූතියි.!'' මුව පැටියා කිව්වා.

''මම ඔයාට තෑග්ගක් දෙන්නම්'' මුව පැටියා එයාගේ පිටේ තිබුණු තිත් වලින් හදපු ලස්සන ගවුමක් දුන්නා.



අයංසාට කවුදෝ කතා කරන සද්දයක් ඇහුණා.

''නැගිටලා එන්න, අපිත් එක්ක සෙල්ලම් කරන්න.''

අයංසා ඇස් ඇරලා බැලුවා.



''අයංසා, ඔයාට හොඳටම නින්ද ගිහින් හිටියේ....''
අහිංසා කිවුවා.

අයංසා නැගිටලා එතන හිටපු යාළුවෝ හැමෝම
එක්ක සතුටින් සෙල්ලම් කරා.

**නිමි.**

 0

පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023 10 20

**ISBN 978-624-206-907-4**